# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1809/4 - 2013 මැයි මස 06 වැනි සඳුදා - 2013.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/80

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2013 අප්‍රේල් මස 19 වන දින,
කොළඹ දී ය.

නියෝග

2009 සැප්තැම්බර් මස 1 වන දින අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2009 ආහාර (ප්‍රතිඔක්සිකාරක) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

1. එහි 4 වන නියෝගයේ අතුරු විධානයෙහි -
"ළදරුවන් සහ කුඩා ළමයින් සඳහා" යන වචන වෙනුවට "ළදරුවන් හෝ කුඩා ළමුන් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

2. එහි 9 වන නියෝගයෙහි -

(අ) "ප්‍රතිඔක්සිකාරකය" යන යෙදුමේ අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :

"ප්‍රතිඔක්සිකාරකය " යන්නෙන් ඔක්සිකරණය මගින් නරක් වීමට එරෙහිව ආරක්ෂා කිරීම මගින් ආහාරවල සජීවී ජීවී කාලය දීර්ඝ කරන්නාවූ ආහාර ආකලන ද්‍රව්‍යයක් අදහස් වේ ;

(ආ) "ළදරුවන්" යන යෙදුමේ අර්ථ නිරූපනයට ඉක්බිතිව පහත දැක්වෙන අර්ථ නිරූපනය ඇතුලත් කිරීමෙන් :

"ළදරුවන් හෝ කුඩා ළමුන් සඳහා වූ ආහාර" යන්නෙන් ළදරුවන් හෝ කුඩා ළමුන් සඳහා විශේෂයෙන්ම සකස් කරන ලද, නිෂ්පාදිත හෝ අලෙවිකරණය කරන ලද ආහාර ද්‍රව්‍යය අදහස් වේ ;

(ඇ) කුඩා ළමයින් යන යෙදුමේ අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :

"කුඩා ළමුන් " යන්නෙන් වයස මාස දොළහ සහ වයස මාස තිස් හය අතර වයයේ පසුවන ළමුන් අදහස් වේ ;

05 - 513


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 1622 — 3310 (2013/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*